

# වසත් මතක

සිත්තරෙකුගේ මතක සටහන්

වසන්ත ශ්‍රීනාත් කුරුකුලසූරිය

1994 වසරේ එක් දිනයක මා හට ශ්‍රී ලංකාවේ පළමුවැනි විධායක ජනාධිපතිවර ජේ. ආර්. ජයවර්ධන හමුවීමට, ඔහු එවකට විශ්‍රාම සුවයන් සිටි වෝඩ් පෙදෙසේ නිවසට යාමට සිදුවූයේ, ඔහු ගේ චරිතාපදානය අළලා ලියූ කෘතියේ කවරය සැළසුම් කිරීමට මට පැවරුණු නිසා ය..

සුදු පැහැ ජාතික ඇඳුමෙන් සැරසී තම කාර්යාල කාමරය තුළ මා බලාපොරොත්තුවෙන් සිටි මේ වයෝවෘද්ධ මිනිසාගේ ප්‍රතාපවත් බව මට දුර තියා

අප අසුන් ගත් ඔහුගේ කාර්යාලය වූ, ඒ විශාල සතරැස් ආගාරය තුල වෙනත් ගෘහ භාණ්ඩයක් නොතිබුණු අතර බිත්ති හතර පුරාම සීලිමේ සිට හිණ මට්ටම දක්වා විවිධ ප්‍රමාණයේ ඡායාරූප වලින් වැසී තිබුණි. එතැන අඩුම තරමේ ඡායාරූප එක්දහස් පන්සියයක් වත් තිබෙන්නට ඇති. ඒ අතර ඔහුගේ එකදු ආලේඛ්‍ය චිත්‍රයක් හෝ විකට (caricature) චිත්‍රයක් තිබේද කියා බලන ලෙස මට "අණ" කෙරිණි.

සැබැවින්ම නැත.



## ජේ ආර් නොදුටු සිත්තම

පෙනුණි. විනාඩි කීපයක් ආ ගිය තොරතුරු කතා කරන අතරතුර එලිනා ජයවර්ධන මැතිණියද ඒ අසළට පැමිණියාය. ජනාධිපති පුද්ගලික ලේකම් ප්‍රේමතිලක මාපිටිගමද මා සමග සිටි අතර තේ පැන් සංග්‍රහයකින් පසු මා විසින් සූදානම් කරගෙන ගිය cover visual එක හිටපු ජනාධිපති වරයාට පෙන්වූයෙමි.. කෘතහස්ත රජයේ නිලධාරියකු වූ ප්‍රේමතිලක මාපිටිගම යනු මගේ පියාගේ ද පැරණි පාසල් මිතුරකු හා අප පවුලේ මිතුරකුද වූ අතර, කෘතියේ කවරය ගැන ඔහු සියයට සියයක්ම සෑහී මට පත්ව සිටියේය. මා එයට යොදා තිබුණේ ජයවර්ධන මහතාගේ මුහුණේ පැති පෙනුමක (Profile) චිත්‍රයකි. ගැඹුරු කල්පනාවක නිමග්නව සිටින ඡායාරූපයක් ඇසුරින් නිමැවූ එය ඔහුගේ කෘතියේ කවරයට ඉතා උචිත එකක් වූ බව මගේ විශ්වාසය විය.

cover visual එක අතට ගත් හිටපු ජනාධිපති වරයාගේ මුහුණේ ඉරියව් වෙනස් වූ බව අප දෙදෙනාටම පෙනුණි. ඒ දෙස සුලු මොහොතක් බලා සිටි ඔහු කවර නිමාව සිදුවන්නේ කෙසේදැයි මගෙන් විමසා සිටියේය. ඔහුගේ ආලේඛ්‍ය චිත්‍රයක් (portrait) යොදාගැනීමට මා අදහස් කරන බව පැවසූ විට මඳක් සිනාසුණු මුහුණෙන් ඔහු "That will not work" යැයි පැවසීය.

අසුන්ගෙන සිටි සිටි මේසයේ ලාච්චුවක් ඇර ඡායාරූපයක් අතට ගත් හිටපු ජනාධිපති වරයා එය මා දෙසට හැරවීය. එය සිනාමුසු මුහුණෙන් ඉදිරිය බලාසිටින (Front) ඔහුගේ ඡායාරූපයකි. එය බොහෝ අවස්ථා වලදී භාවිතා කළ ඔහු ඉතා ප්‍රිය කළ ඡායාරූපයක් බව මම දැන සිටියෙමි. ඉන් පසු ඔහු කී වැකිය තවමත් මගේ දෙසවන රැඳී පවතී... දකුණතින් අල්ලාගෙන සිටින ඡායාරූපය දෙසට වමතේ දබරැඟිල්ල දිගු කළ හිටපු ජනාධිපතිවරයා "You can not beat a photograph" යැයි පැවසූයේ සරදම් සිනාවක් මුහුණේ රුවා ගනිමිනි.

ඡායාරූප ශිල්පියෙකුට නොපෙනෙන මානයකට චිත්‍ර ශිල්පියාට ගමන් කළ හැකි බව මා පැහැදිලි කළ ද ඔහුගේ නිගමනය අවසාන තීරණය විය.. ඔහු තෝරාදුන් ඡායාරූපය යොදාගනිමින් ග්‍රන්ථ කවරය නිමකිරීමට තීරණය විය.

ආපසු එන ගමනේ දී ප්‍රේමතිලක මාපිටිගමයන් මා අස්වසාලූයේ පිටිය මැදට ගොස් බින්දුවට දැවී ගොස් නැවත ක්‍රීඩාංගණයට පෙරළා එන පිතිකරුවකු අස්වසාලන්නට උත්සාහ කරන උග්‍ර ක්‍රීඩා ලෝලියකු පරිද්දෙනි. ග්‍රන්ථ කවර නිර්මාණය සිතූ පරිදි සිදු නොවීමෙන් මා බොහෝ සේ කම්පනයට පත්ව ඇතැයි ඔහු සිතුවා විය හැකිය.




විධායක ජනාධිපතිවරයා වශයෙන් මුලු රටටම බලපාන ලද මුරණ්ඩු තීරණ ගත් මේ හිතුවක්කාර දේශපාලනඥයාගේ තවත් එක් දළදඬු තීරණයක් සියැසින්ම දැකගන්නට ලැබීම කවර නිර්මාණයට වඩා බෙහෙවින් වටිනා අත්දැකීමක් බව පහදා දෙමින් මම ඔහු අස්වසාලූයෙමි. එහිදී අලේඛ්‍ය චිත්‍ර සහ විකට චිත්‍ර ගැන ජයවර්ධන ජනාධිපතිවරයාගේ ඇති අකැමැත්ත ගැන ඉඟියක් මට මාපිටිගමයන්ගෙන් ලබා ගැනීමට හැකිවිය.

ඇත්තෙන්ම මා පැරදුණේ කැමරාවට නොව ඔහුගේ පැසුණු බුද්ධිය සංකේතවත් කළ මුහුණේ රැළි වලටත් හිසකේ වලින් තොර වෙමින් පැවති තට්ටය පෑදුණු හිසටත් යයි කිවහොත් වඩා නිවැරදිය. ආලේඛ්‍ය විත්‍රශිල්පියා අතින් වැරදීමකින් මුහුණට පමණට වඩා වයස්ගත පෙනුමක් ලැබීමේ හෝ මුහුණ විකෘති වීමේ අවදානමක් ඇතැයි ඔහු තුළ වූ සිතුවිල්ල නිසාම කිසිදු ආලේඛ්‍ය චිත්‍රයක් විකට චිත්‍රයක් හෝ කාටූනයක් ඔහු පදිංචිව සිටි



වෝඩ් පෙදෙසේ නිවසට වැද්ද නොගැනීමට ඔහු වග බලාගත් අතර ඒ සියළු නිර්මාණ ධර්මපාල මාවගේ පිහිටි ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රයේ තැන්පත් කෙරිණි.

මේ අපූරු වියපත් දේශපානඥයා 1996 නොවැම්බර් පළමුවැනිදා වයස අවුරුදු 90 දී සදහටම දෙනෙත් පියාගත් අතර ඔහුගේ මරණයෙන් වසර කිහිපයකට පසු දෛවෝපගත ලෙස ඔහු අකමැති ඒ දෙය කිරීමට මට සිදුවිය.

පාර්ලිමේන්තුවේ ප්‍රදර්ශනය වන සජීවී ප්‍රමාණයේ ඔහුගේ ආලේඛ්‍ය චිත්‍රයත්, ඔහු වෙනුවෙන් නිකුත් කෙරුණ සමරු මුද්දරයත් මුල් දින කවරයත්, ඔහු වෙනුවෙන් ලියන ලද තවත් ග්‍රන්ථ කවරයකුත් මා අතින් නිමවූයේ මෙලෙස යි.

අවසන් වශයෙන් ඔහු ජීවත්ව සිටියදී ඔහුගේ ආලේඛ්‍ය චිත්‍රයක් කිරීමට නොහැකි වීම පිළිබඳව කණගාටුවක් හෝ ඔහු මියගිය පසු එය කරන්නට ලැබීම ගැන විශේෂ සතුටක් හෝ මට නැත.

